Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of

## කාර්ය පත්‍රිකාව - 24 වන සතිය

- **නිපුණතාව 0.2 - නර්තනය හා සබැඳි සිද්ධාන්ත අධ්‍යයනය කරමින් ප්‍රායෝගිකව භාවිත කරයි.**
- **නිපුණතා මට්ටම 2.1 - රස භාව සංකල්ප පිළිබඳ තොරතුරු විමසුමට ලක් කරයි**

## I කොටස

**නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

(01) පුද්ගලයෙකුගේ සිත තුළ පහළ වන ස්ථායි භාවයන් අවදි කිරීමට මුල් වන්නේ

(i) ආලම්භන විභාවයයි
(ii) විභාවයයි
(iii) උද්දීපන විභාවයයි
(iv) ව්‍යාභිචාරී විභාවයයි
(v) ආනුභාවයයි

(02) විභාවය ආලම්භන හා උද්දීපන වශයෙන් කොටස් දෙකකට බෙදා දක්වා ඇත්තේ

(i) ධනංජයගේ දශරූපයෙහි හා විශ්වනාථගේ සාහිත්‍ය දර්පණයේයි
(ii) භරතමුණිගේ නාට්‍ය ශාස්ත්‍රයේ හා ධනංජයගේ දශරූපයේයි
(iii) විශ්වනාථ ගේ සාහිත්‍ය දර්පණයෙහි හා නන්දිකේශ්වරගේ අභිනය දර්පණයේයි
(iv) නන්දිකේශ්වරගේ අභිනය දර්පණයෙහි හා භරතමුනිගේ නාට්‍ය ශාස්ත්‍රයේයි
(v) නන්දිකේශ්වරගේ අභිනය දර්පණයෙහි හා ධනංජයගේ දශරූපයේයි

(03) භරතමුනිගේ නාට්‍ය ශාස්ත්‍රයට අනුව ව්‍යාභිචාරී භාව ගණන

(i) 23 කි
(ii) 31 කි
(iii) 32 කි
(iv) 33 කි
(v) 30 කි

(04) මනුෂ්‍ය කැමැත්ත රහිතව ඇතිවෙන භාව අතරින් ස්තම්භ හා වෙපථු යනු

(i) දහඩිය දැමීම හා කටහඬ වෙනස් වීමයි
(ii) සිහි මුර්ජාව හා වෙවුලීමයි
(iii) ශරීරය දරදඬු වීම හා වෙවුලීමයි
(iv) ශරීරය දරදඬු වීම හා කඳුළු ගැලීමයි
(v) වෙවුලීම හා ලොමු දැහැ ගැනීමයි

(05) දේශීය ශාන්තිකර්මයන්හි රසභාව වැඩි වශයෙන් දක්නට ලැබෙන ශාන්තිකර්මය වන්නේ

(i) කොහොඹා කංකාරිය තුළ
(ii) පහන් මඩුව තුළ
(iii) රට යකුම තුළ
(iv) දෙවොල් මඩුව තුළ
(v) බලි ශාන්තිකර්මය තුළ

**හිස්තැන් පුරවන්න**

(01) භරතමුණිවරයාගේ නාට්‍ය ශාස්ත්‍රයට අනුව විභාව, අනුභාව, ........................................................................................................ භාව සංයෝගයෙන් රස නිෂ්පත්තිය සිදු වේ.

(02) භාවයට අනුකූලව පුද්ගලයකුගේ මුහුණේ හටගන්නා වෙනස්කම් ........................................................................ භාව නම් වේ.

(03) මනුෂ්‍ය කැමැත්තෙන් තොරව සිදුවන භාව .......................................................................... වේ.

(04) නාට්‍ය ශාස්ත්‍රයට අනුව කලකිරීම, වෙහෙස, මහන්සිය වැනි හැඟීම් ............................................................................ භාව වේ.

(05) නාට්‍යයක හා නර්තනයක රස ජනිත කරවීමට චලන, රංගවස්ත්‍රාභරණ, හැඟීම් හා ................................................................................................................ ඉතා වැදගත් වේ.

## II කොටස

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න**

(01) රස නිෂ්පත්තිය සිදුවන ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(02) භාව උද්දීපනය සඳහා දේශීය නර්තන කලාවේ යොදාගෙන ඇති උපක්‍රම විස්තර කරන්න.

(03) දේශීය නර්තන සම්ප්‍රදායන් වල රස භාව දැකිය හැකි අවස්ථා ශාන්තිකර්ම ඇසුරින් විස්තර කරන්න.